සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Rerved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

11 | S | I

## Grade 10 - Second Term Evaluation - 2024

දෙවන වාර ඇගයීම - 2024 - 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

## Buddhism - I

කාලය : පැය 01
Time : 1 hour

Name : .................................................. Class : .................... Index No : ......................

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01. වෙනස් වීම් නිසා ඇති වන දුක මෙසේ හඳුන්වමු
    (1) අනිත්‍ය (2) දුක්ඛ (3) අනාත්ම (4) විපරිනාම

02. පංචස්කන්ධයට අයත් වේ.
    (1) සංඛාර (2) මරණය (3) දිරායෑම (4) සිත

03. තිලක්ෂණය මෙනෙහි කිරීමෙන් (ප්‍රගුණ කිරීම) ලැබෙන ප්‍රයෝජනයකි.
    (1) අට්ලෝ දහමින් කම්පා නොවේ.
    (2) ප්‍රියයන්ගෙන් වෙන් වේ.
    (3) මෛත්‍රීය ප්‍රගුණ වේ.
    (4) ආත්මය යන්න විශ්වාස කරයි.

04. බුදු දහමේ මූලික ඉගැන්වීමකි.
    (1) ත්‍රිලක්ෂණය (2) අනාත්ම (3) පංචශීලය (4) ලෙඩ වීම

05. කුසල මූලයකි.
    (1) මෝහය (2) ලෝභය (3) අමෝහය (4) අවිද්‍යාව

06. දෙවන ආත්ම භවයෙන් පසු නිවන් දක්නා ජාති දක්වා විපාක දෙන කර්මය අප හඳුන්වන්නේ,
    (1) අපරාපරිය වේදනීය කර්මය (2) අහෝසි කර්මය
    (3) කටත්තා කර්මය (4) ජනක කර්මය

07. ආසන්න කර්මයට උදහරණයකි.
    (1) කඨින පිංකම
    (2) මට්ටකුණ්ඩලී තරුණයා දෙව්ලොව ඉපදීම
    (3) සුජාතාවගේ කිරිපිඩු දනය
    (4) පූතිගත්ත තිස්ස තෙරුන්ගේ කථාව

08. "අත්තුපනායක ධර්ම පර්යාය" යන්නෙහි අර්ථය වන්නේ
    (1) තමා උපමා කොට අනුන් ගැන සිතීම
    (2) තමා ගැන පමණක් සිතා බලා කටයුතු කිරීම
    (3) පරාර්ථ චර්යාවෙහි හැසිරීම.
    (4) ලද දෙයින් සතුටු වීමේ ගුණය

09. වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පංච ශීලය වනා හි බෞද්ධයන්ට ම ආවේණික ප්‍රතිපදාවකි.
(2) තිලක්ෂණය, චතුරාර්ය සත්‍යය, හේතුඵල දහම, සියළු ජාතීන්ට පොදු ය.
(3) ආගම, ජාති, කුල වැනි පටු ආකල්ප තුළින් එකිනෙකා දෙස වෛරයෙන්, නොසතුටින් බැලීම බුදු දහම අනුමත කරයි.
(4) අටලෝ දහම බුදු දහමේ මූලික ඉගැන්වීමකි.

10. පද්මාකාර ජීවිතය හඳුන්වන වෙනත් නාමයකි.
(1) සියපත (2) සල්ලේඛ ප්‍රතිපදාව (3) සහශ්‍රය (4) පංච නීවරණය

11. බුදු දහමේ සඳහන් වන පෞරුෂ වර්ධන මට්ටම් තුනෙන් එකකි.
(1) මිත්‍ර ප්‍රතිරූපකයන් (2) කල්‍යාණ මිත්‍රයන්
(3) උත්තම පෞරුෂ පුද්ගලයන් (4) අධම, විෂම පුද්ගලයන්

12. බුදුන් වහන්සේගේ ජීවිතය "පද්මාකාර" බව පෙන්වන අවස්ථාවකට උදාහරණයකි.
(1) හිටියොත් හොඳට හැඳි දෙවියොත් නමට වඳී
(2) උගතමනා ශිල්පයමයි මතු රැකෙනා
(3) වෛර කරන්නවුන් අතර අවෛරව වාසය කරමු
(4) අපවිත්‍ර ලෝකයේ පවිත්‍රව ජීවත්වීම.

13. සිඟාලෝවාද සූත්‍රයට අනුව සමාජය කොටස්,
(1) හයකට බෙදේ (2) හතකට බෙදේ
(3) හතරකට බෙදේ (4) අටකට බෙදේ

14. සිඟාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිශාව නියෝජනය කෙරේ
(1) මිතුරන් (2) ගිහි පැවිදි (3) ගුරු ශිෂ්‍ය (4) මව් පිය

15. ස්වාමියා විසින් භාර්යාවට කළ යුතු යුතුකමකි.
(1) අවමන් නොකිරීම (2) මැනවින් හික්මවීම
(3) අවශ්‍ය කටයුතු කරදීම. (4) ධනය ආරක්ෂා කර දීම

16. වඩාත් නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
(1) කය හා වචනය සංවර කර ගැනීම සීලයයි.
(2) කය, වචනය, මනස සංවර කර ගැනීම සීලයයි.
(3) කය සංවර කර ගැනීම සීලයයි.
(4) සිත සංවර කර ගැනීම සීලයයි.

17. ශීලය සම්පූර්ණ වීමට තිබිය යුතු අංගයකි.
(1) විරතිය (2) මෛත්‍රිය (3) විවරණය (4) වායාම

18. දියුණු වන පුද්ගලයෙකු ළඟ තිබිය යුතු චරිත ලක්ෂණ හත ඇතුළත් ගාථාව කුමක් ද?
(1) අචරිත්වා බ්‍රහ්ම චරියං ......... (2) දූරංගමං ඒකචරං ........
(3) උට්ඨානවතෝ සතිමතෝ ...... (4) අසාරේසාරමතිනෝ ......

19. "පිණ්ඩපාතික අසරණ - සරණ" යන ගෞරව නාමයෙන් හැඳින් වූ භික්ෂූන් වහන්සේ කවුද?
(1) වැලිවිට සරණංකර සංඝරාජ හිමි (2) වාරියපොළ සුමංගල හිමි
(3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (4) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

20. "සරාර්ථ සංග්‍රහය" රචිත ගත් කතුවරයා මේ නමින් හැඳින්වේ.
(1) රේරුකානේ චන්ද්‍රවිමල හිමි (2) වැලිවිට සරණංකර හිමි
(3) වීදගම මෛත්‍රීය හිමි (4) රත්මලානේ ධර්මාරාම හිමි

21. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවේ" මේ කියමන ප්‍රකාශ කළ රාජ්‍ය පාලකයා කවුද?
(1) ධර්මාශෝක රජතුමා (2) දුටුගැමුණු රජතුමා
(3) විජයබාහු රජතුමා (4) කාවන්තිස්ස රජතුමා

22. දුටුගැමුණු කුමරු පියා සමඟ අමනාප ව සැඟවී සිටියේ කොහේ ද?
(1) කොත්මලේ ය. (2) කෝට්ටේ ය.
(3) රුහුණු රට ය. (4) රුවන් පුරය

23. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නමකි.
(1) සමථ භාවනාව (2) ත්‍රිලක්ෂණ භාවනාව
(3) සමාධි භාවනාව (4) පිළිකුල් භාවනාව

24. මහා භූත රූප හතරින් එකකි.
(1) තේජෝ (2) සංඛාර (3) සෝත (4) නිපකෝ

25. පංචනීවරණ ධර්මවලින් එකකට උපමා කර ඇත.
(1) රාගය (2) ද්වේෂය
(3) මෝහය (4) පාසි බැඳුන වතුර

26. සමථ භාවනාව සඳහා යොමු වීමට ප්‍රථම පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංගයකි.
(1) ඉන්ද්‍රිය සංවරය (2) මෛත්‍රිය (3) ඉවසීම (4) කරුණාව

27. භාවනාවේ පූර්ව කෘත්‍යයකි.
(1) සිල්වත්වීම (2) ඇවිදීම.
(3) ඇමදීම (4) සතිය පවත්වා ගැනීම

28. යහපත් ධර්ම මාර්ගය අනුගමනය කිරීම
(1) ආහුණෙය්‍යය නම් වේ. (2) සාමීචිපටිපන්නෝ නම් වේ.
(3) අංජලිකරණීයෝ නම් වේ. (4) සුපටිපන්නෝ නම් වේ.

29. බුදුගුණ,
(1) 9 කි. (2) 8 කි. (3) 18 කි. (4) 11 කි

30. ත්‍රිවිධ රත්නයේ ගුණ ප්‍රමාණය,
(1) 24 කි. (2) 29 කි. (3) 18 කි. (4) 20 කි.

31. පංච මහා විලෝකනයට අයත් නොවේ.
(1) කාලය (2) දීපය (3) දේශය (4) ධනය

32. බෝසතාණෝ ගිහි කළ ශිල්ප ශාස්ත්‍රය හදළේ,
(1) සර්වමිත්‍ර බමුණාගෙනි. (2) අසිත බමුණාගෙනි
(3) ආලාර කාලාම බමුණාගෙනි. (4) කොණ්ඩඤ්ඤ බමුණාගෙනි

33. "මෙවැනි ස්වාමියෙක් ලද බිරිඳ නිවීම ලැබ සිටින්නීය" යනුවෙන් ප්‍රකාශ කළේ,
(1) සුජාතා දේවිය (2) කිසාගෝතමී දේවිය
(3) ප්‍රජාපති දේවිය (4) යශෝධරා දේවිය

34. යශෝධරා දේවියගේ පියාගේ නම වන්නේ,
(1) බිම්බිසාර රජ (2) කොසොල් රජ (3) සුප්‍රබුද්ධ රජ (4) මහානාම රජ

35. සිදුහත් කුමරාගේ විවාහය හා අභිනිෂ්ක්‍රමණය සිදු වූයේ පිළිවෙළින්,
(1) වයස 16 දී හා 20 දී ය. (2). වයස 15 දී හා 29 දී ය.
(3) වයස 16 දී හා 29 දී ය. (4) වයස 16 දී හා 28 දී ය.

36. බුද්ධ ශාසනයේ සංඝ සමාජය ආරම්භ වන්නේ,

(1) පස්වග මහණුන්ගෙනි
(2) යස කුල පුත්‍රයාගෙනි.
(3) ජටිල සහෝදරයන්ගෙනි
(4) භද්ද වග්ගිය කුමාරවරුන්ගෙනි.

37. පස්වග මහණුන් වහන්සේලාට අයත් නොවේ.

(1) වප්ප හිමි
(2) මහානාම හිමි
(3) අස්සජි හිමි
(4) ධම්මාරාම

38. භාවනාව සඳහා අවශ්‍ය වන කර්මස්ථාන ගණන පෙළ පොත්වල සඳහන් වන්නේ

(1) 22 කි.
(2) 06 කි.
(3) 40 කි.
(4) 18 කි.

39. බුදු දහමේ සඳහන් පුද්ගල චරිත හයට අයත් නොවේ.

(1) සද්ධා චරිත
(2) රාග චරිත
(3) රූප චරිත
(4) මෝහ චරිත

40. බුදු සසුනේ සුවිශේෂි ආරාමයක් වන ජේතවනාරාමය ඉදිකළේ මොහු ය.

(1) විශාඛා සිටු දේවිය
(2) බිම්බිසාර රජතුමා
(3) අනේපිඩු සිටුතුමා
(4) කොසොල් රජතුමා

***

PAST PAPERS WIKI

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Rerved

Past Papers Wiki

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 11 | S | II |
|---|---|---|

## Grade 10 - Second Term Evaluation - 2024

දෙවන වාර ඇගයීම - 2024 - 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

## Buddhism - II

කාලය : පැය 02
Time : 2 hours

**උපදෙස්**

* **පළමු** ප්‍රශ්නය **අනිවාර්ය** වේ.
* **පළමු ප්‍රශ්නය** ඇතුළු තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු ලියන්න.

01. (i) සිදුහත් කුමරුගේ දෙමාපියන් නම් කරන්න.
(ii) සිදුහත් කුමරුට තනවා දුන් මාළිගා 2 ක් නම් කරන්න.
(iii) බුද්ධ රත්නයේ ගුණ 2 ක් නම් කරන්න.
(iv) පංච නීවරණ ධර්ම අතරින් 2 ක් නම් කර එහි අර්ථ දෙක ලියන්න.
(v) භාවනාවට පිවිසෙන තැනැත්තෙකු විසින් ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා 2 ක් ලියන්න.
(vi) වැලිවිට අසරණ සරණ සරණංකර හිමියන් විසින් තම ආරාම පිළිසුම් දෙරටුවේ ලියා තැබූ වචන තුන ලියන්න.
(vii) විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.
(viii) පංච ඉන්ද්‍රියන් ට ගෝචර වන අරමුණු 2 ක් නම් කරන්න.
(ix) "චිත්තං සමේනිනි සමථෝ" යන්නෙහි අර්ථය ලියන්න.
(x) ධම්මපදයේ ගාථා ගණන හා වග්ග ගණන ලියන්න.

(ලකුණු 2 x 10 = 20 )

02. (i) පංච විලෝකනය අතරින් හතරක් නම් කරන්න. (ල. 02)
(ii) බෝසත් උපතක් සමඟ සිදු වූ අසිරිමත් සිදුවීම් තුනක් නම් කරන්න. (ල. 03)
(iii) සිදුහත් බෝසතාණෝ විවිධ අභියෝග වලට මුහුණ දුන් ආකාරය තුළින් ශිෂ්‍ය ජීවිතයට ගතහැකි ආදර්ශ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 05)

03. (i) භාවනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)
(ii) සමාධි භාවනාවට පිවිසෙන තැනැත්තා තුළ තිබිය යුතු ගුණාංග තුනක් වේ. ඒවා නම් කරන්න. (ල. 03)
(iii) සමාධි භාවනාව වැඩීම තුළින් දෛනික ජීවිතයට ලැබෙන ප්‍රයෝජන උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 05)

04. (i) "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ" ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 02)
(ii) ඉහත ගාථාවේ තේරුම ලියන්න. (ල. 03)
(iii) ඉහත ගාථාව ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න. (ල. 05)

05. (i) දුටුගැමුණු රජතුමාගේ අභීත සටන් පාඨය ලියන්න.

(ii) දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද විහාරාරාම තුනක් නම් කරන්න.

(iii) දුටුගැමුණු රජතුමා විසින් ඉටුකරන ලද ආගමික හා ශාසනික මෙහෙවර ඇගයීමට ලක් ක

06. (i) පද්මාකාර ජීවිතය යනු කුමක් ද?

(ii) පද්ම උපමාව අනුව බුදුරදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයින් නම් කරන්න.

(iii) නරක මිනිසුන් අතර හොඳ මිනිසෙකු වෙමු. උදහරණ සහිතව පැහැදිලි කරන්න.

07. පහත සඳහන් ඒවායින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) විදර්ශනා භාවනාව

(ii) දෙමාපිය දූ දරු සම්බන්ධතාවය

(iii) ත්‍රි ලක්ෂණය

(iv) දිට්ඨ ධම්මවේදනීය කර්ම

(ලකුණු 5 x 2

***

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න